**2024-11-05 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ගාලු මුවදොර පිටියෙහි පරිපාලන හා මෙහෙයුම් කටයුතු**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් වන ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා පුද්ගලික සමාගමේ කළමනාකරණය සහ පරිපාලනය යටතේ පවතින ගාලු මුවදොර පිටිය ආගමික කටයුතු හැර වෙනත් කටයුතු සඳහා භාවිත කිරීම පිණිස අවසර ලබා නොදීමට 2023-04-17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. ගාලු මුවදොර පිටිය පරිපාලනය හා නඩත්තුව සඳහා මාසිකව ආසන්න වශයෙන් රුපියල් මිලියන 2.5 - 3.0ක පමණ පිරිවැයක් දැරීමට සිදු වන අතර, එම මුදල ආවරණය කර ගැනීමට සහ 2023 වසරට පෙර පැවති ආකාරයෙන් දෙස් විදෙස් සංචාරකයින්ට නිදහසේ ගැවසිය හැකි වඩාත් ආකර්ෂණීය හා ආරක්ෂිත ස්ථානයක් වශයෙන් මෙන්ම ජනතාවට නිදහසේ සහභාගිවීමට අවකාශ සලසන උත්සව, සංගීත ප්‍රසංග හා වෙනත් සැමරුම් සඳහා සුදුසු නිර්ණායකයන්ට යටත්ව ගාලු මුවදොර පිටිය භාවිත කිරීමට අවස්ථාව සලසා දීම යෝග්‍ය බව පෙනී ගොස් ඇත. ඒ අනුව, "පිරිසිදු හා හරිත ගාලු මුවදොර පිටියක්" යන සංකල්පය මත පදනම්ව ගාලු මුවදොර පරිපාලනය වඩාත් ක්‍රමවත්ව හා විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**02. 2025 වර්ෂය සඳහා මහජන චීන සමූහාණ්ඩුව විසින් ප්‍රදානයක් ලෙස ලබා දෙන පාසල් නිල ඇඳුම් රෙදි, පාසල් හා පිරිවෙන් සිසුන් වෙත බෙදාහැරීම**

2025 වර්ෂය සඳහා අවශ්‍ය පාසල් නිල ඇඳුම් රෙදි මුළු අවශ්‍යතාව රෙදි මීටර මිලියන 11.82ක් පමණ වේ. එම සම්පූර්ණ ප්‍රමාණයම, ප්‍රදානයක් ලෙස ලබා දීමට මහජන චීන සමූහාණ්ඩුව විසින් එකඟතාව පළ කර ඇත. මෙම රෙදි තොගයට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවන ලද නියැදිය ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA) මඟින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එම රෙදි පාසල් සිසුන්ගේ භාවිතය සඳහා සුදුසු බවට නිර්දේශ කර තිබේ. ඒ අනුව, 2025 වර්ෂය සඳහා සියලුම පාසල් හා පිරිවෙන් සිසුනට නිල ඇඳුම් රෙදි සපයා දීම සඳහා චීන රජයේ ප්‍රදානය භාර ගැනීම පිණිස අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු දුා T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. කිලෝමීටර 100,000 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ සහතික කළ බිල්පත් වෙනුවෙන් ගෙවීම් කිරීම

වසර 05ක ව්‍යාපෘති කාලසීමාවක් සහිතව කිලෝමීටර 100,000ක මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන 2020 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර 2023 වර්ෂයේ සිට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එකී වැඩසටහන යටතේ මේ වන විට රුපියල් බිලියන 28.37ක හිඟ බිල්පත් පියවීමට ඉතිරිව පවතී. එසේම, අත්‍යවශ්‍ය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2024 වර්ෂයේදී රුපියල් බිලියන 20ක් වෙන් කරනු ලැබ ඇති අතර, ඒ යටතේ කිලෝමීටර 1,000ක් ප්‍රතිසංස්කරණය කිරීම පිණිස හඳුනාගනු ලැබ ඇත. එම වැඩසටහන් දෙක යටතේ නිරවුල් කළ යුතුව පවතින හිඟ බිල්පත් පියවීම සඳහා 2024 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති, එහෙත් මේ දක්වා භාවිත කර නොමැති ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (BIA) පිටත්වීමේ පර්යන්තයෙහි ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුළු ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රසම්පාදනය

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (BIA) පිටත්වීමේ පර්යන්තයෙහි ව්‍යවහාර මුදල් කවුළු 05ක් ක්‍රියාත්මක කිරීම සඳහා සීමිත ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂ බැංකු සහ විදේශ ව්‍යවහාර මුදල් ව්‍යාපාරයේ නියුක්ත සීමිත වෙළෙඳුන් වෙතින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා, ආයතන පහක් (05) විසින් ලංසු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, තාක්ෂණ ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව වසර 03ක කාල සීමාවක් සඳහා පහත සඳහන් ආයතන වෙත ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුළු ක්‍රියාත්මක කිරීම පැවරීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ නිර්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* කවුළු අංක 25 — රුපියල් මිලියන 798.028 + බදු සහිත මුදලකට ලංකා බැංකුව වෙත
* කවුළු අංක 02 — රුපියල් මිලියන 633.662 + බදු සහිත මුදලකට සම්පත් බැංකුව වෙත

| | | |
|---|---|---|
| * | කවුළු අංක 04 | රුපියල් මිලියන 381.364 + බදු සහිත මුදලකට කොමර්ෂල් බැංකුව වෙත |
| * | කවුළු අංක 10 | රුපියල් මිලියන 299.064 + බදු සහිත මුදලකට තෝමස් කුක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත |
| * | කවුළු අංක 11 | රුපියල් මිලියන 225.689+ බදු සහිත මුදලකට හැටන් නැෂනල් බැංකුව වෙත |

**05. වල්ගම-දියගම මාර්ගයේ (බී 452) කිලෝමීටර 0+000 සිට කිලෝමීටර 7+000 දක්වා වූ කොටස පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම**

රක්වාන-සූරියකන්ද මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක ණය මුදලක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල මඟින් ලබා දී ඇත. එම ණය මුදලෙහි ඉතිරි ණය ශේෂය යොදා ගනිමින් කොළඹ දිස්ත්‍රික්කයේ වල්ගම-දියගම මාර්ගයේ කිලෝමීටර 0+000 සිට කිලෝමීටර 7+000 දක්වා කොටස පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසුකරුවන් 08 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර ඇත. තාක්ෂණ ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව රක්වාන-සූරියකන්ද මාර්ග ව්‍යාපෘතියෙහි ඉතිරි ණය ප්‍රතිපාදන යොදා ගනිමින් කොළඹ දිස්ත්‍රික්කයේ වල්ගම-දියගම මාර්ගයේ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව රුපියල් බිලියන 2.44 (වැට් රහිත) මුදලකට මාගා ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා චීන රජයේ ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම**

අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා චීන රජයේ ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම, පැකේජ 03ක් යටතේ ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා චීන රජය විසින් නම් කර ඇති ලංසුකරුවන් 08 දෙනෙකු වෙතින් ලංසු කැඳවා තිබේ. එම ලංසු ඇගයීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත පදනම්ව පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* පැකේජ 01 - මොරටුවේ නිවාස ඒකක 575ක් සහ කොට්ටාවේ නිවාස ඒකක 108ක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව M/s China Railway 25th Bureau Group Co. Ltd වෙත ප්‍රදානය කිරීම.

* පැකේජ 02 - දෙමටගොඩ නිවාස ඒකක 586ක් සහ මහරගම නිවාස ඒකක 112ක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව M/s China Harbor Engineering Company Ltd වෙත ප්‍රදානය කිරීම.

* පැකේජ 03 - පෑලියගොඩ නිවාස ඒකක 615ක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව M/s Shanxi Construction Investment Group Co. Ltd. වෙත ප්‍රදානය කිරීම.

**07. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කිරීම**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එස්.ආලෝකබණ්ඩාර මහතා 2024-10-03 දින සිට අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් කිරීම හේතුවෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුර පුරප්පාඩු වී තිබේ. එම තනතුරේ වැඩබැලීම සඳහා දැනට අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශයේ අතිරේක ලේකම් වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී ආර්.එම්.එන්.ටී.කේ.රණසිංහ මහත්මිය පත් කිරීම පිණිස අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රීති අනෝමා සිරිවර්ධන මහත්මිය වෙත මාස 06ක සේවා දිගුවක් ලබා දීම**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලැබූ ප්‍රීති අනෝමා සිරිවර්ධන මහත්මිය වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2024-11-02 දින සිට විශ්‍රාම ගෙන ඇත. මේ වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) සහ අධ්‍යක්ෂ (මූල්‍ය) වැනි ඉහළ කළමනාකාරිත්ව තනතුරු ගණනාවක් පුරප්පාඩුව පවතී. එම තත්ත්වය යටතේ එම අධිකාරියේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වන පරිදි ප්‍රීති අනෝමා සිරිවර්ධන මහත්මිය මාස 06ක කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත

නැවත සේවයේ යෙදවීම පිණිස කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **2024-12-01 දින සිට 2025-05-31 දින දක්වා කාලය තුළ පෙට්‍රල් 92 Unl නැව් තොග 05ක් මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

2024-12-01 දින සිට 2025-05-31 දින දක්වා කාලය තුළ පෙට්‍රල් 92 Unl නැව් තොග 05ක් (බැරල් මිලියන 1.5ක්) දිගුකාලීන කොන්ත්‍රාත්තුවක් යටතේ සපයා ගැනීම පිණිස ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ගබඩාගත ටැංකිවලින් නිකුත් කිරීමේ දී ගෙවීමේ ක්‍රමවේදය සහ නෞභාරපත නිකුත් කළ දින සිට දින 30කින් ණයවර ලිපියක් මඟින් ගෙවීම් කිරීමේ ක්‍රමවේදය යන විකල්ප ගෙවීම් කොන්දේසි යටතේ ලංසු කැඳවා තිබේ. ඒ අනුව ලංසු 07ක් ලැබී ඇති අතර, මූලික ඇගයීමේදී ලංසු 03ක් ප්‍රතික්ෂේප වී ඇත. ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව අදාළ කොන්ත්‍රාත්තුව නෞභාරපත නිකුත් කළ දින සිට දින 30කින් ණයවර ලිපියක් මඟින් ගෙවීම් කිරීමේ ක්‍රමවේදය යටතේ සිංගප්පූරුවේ විටෝල් ඒෂියා පෞද්ගලික සමාගම වෙත ප්‍රදානය කිරීම පිණිස බලශක්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ තාක්ෂණික හා මූල්‍ය දායකත්වය මත ඌව පළාත සහ උතුරු පළාත කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත තිරසාර ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහ චක්‍රීය ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

ඌව සහ උතුරු පළාත්වල පළාත් පාලන ආයතන මට්ටමින් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ ඒ සම්බන්ධයෙන් වන කළමනාකරණ ගැටලු විසඳීම සඳහා 2024-2028 කාලසීමාව තුළ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස ඇමෙරිකානු ඩොලර් මිලියන 10.20ක මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට කොරියානු රජය එකඟතාව පළ කර ඇත. ඒ අනුව, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ තාක්ෂණික සහාය සහ කොරියානු රජයේ මූල්‍ය ආධාර උපයෝගී කර ගනිමින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. මහා භාණ්ඩාගාරයේ ඉහළ කළමනාකාරිත්වය සඳහා නිලධාරීන් පත් කිරීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කළ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ඩී.ඒ.පී.අබේසේකර මහතා 2024-11-06 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුරකට පත් කිරීම හේතුවෙන් එම තනතුර පුරප්පාඩුව පවතී. එසේම, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී එන්.එස්.එම්.පී.රංජිත් මහතා 2024-11-10 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත බැවින්, එදින සිට එකී තනතුර ද පුරප්පාඩු වීමට නියමිතව ඇත. එමෙන්ම, මහා භාණ්ඩාගාරයේ ස්ථාපිත කිරීමට නියමිත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට සුදුසු නිලධාරියෙකු ද පත් කළ යුතුව තිබේ. ඒ අනුව, මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව පහත සඳහන් පත් කිරීම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

* දැනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ආර්.එම්.එස්.පී.එස්.බණ්ඩාර මහතා 2024-11-06 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම.

* දැනට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී එස්.එස්.මුදලිගේ මහතා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම සහ දූමිටිය සාමාන්‍යාධිකාරී තනතුරේ වැඩබැලීම සඳහා වන ඒ මහතාගේ පත්වීම තවදුරටත් ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීම.

* මහා භාණ්ඩාගාරයේ ස්ථාපිත කිරීමට නියමිත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා දැනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනී උදේනි උඩුගහපත්තුව මහත්මිය 2024-12-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම.

*********